**උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය - 2010**

---------------------------------------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

---------------

1.1 **මතය**

------

**මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.**

1.2 **ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

--------------------------

**උපරිමාධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.**

1.2.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

----------------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) **සමාලෝචිත වර්ෂය අවසානයට පැවති එකතුව රු: 3,543,248 ක් වූ ණයගැති ශේෂ 73 කින් එකතුව රු: 3,081,082ක ශේෂයන් 67 ක් වසර 1-5 ත් අතර කාලයක්ද එකතුව රු: 462,166 ශේෂයන් වසර 05 කට වඩා වැඩි කාලයක් ද හිඟ හිට පැවතිණි.**

(ආ) **සමාලෝචිත වර්ෂය අවසානයට පැවති මුළු එකතුව රු: 470,383 ක් වූ ණයහිමි ශේෂ 41 කින් එකතුව රු: 192,221 ක ශේෂයන් 24 ක් වර්ෂ 1-5 ත් අතර කාලයක සිට ද එකතුව රු: 278,162 ක් වූ ශේෂයන් 17 ක් වර්ෂ 05 ට වැඩි කාලයක සිට ද නිරවුල් නොකර පැවතිණි.**

1.2.3 **නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

-----------------------------------------------------------------------

පහත සඳහන් නීති,රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) මු.රෙ. 371සහ 2008 මැයි 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 428 | සුළු මුදල් අග්‍රිමය රු. 7,500ක් වුවද, මණ්ඩලය විසින් රු.30,000ක් සුළු මුදල් අග්‍රිමය ලෙස භාවිතා කර තිබුණි. |
| (ආ) 2004 පෙබරවාරි 24 දිනැති අංක 2004/01 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුලත ඉදිරිපත් නොකිරීම. |
| (ඇ) 1978 දෙසැම්බර් 19 දින අංක 842 දරන ස්ථාවර වත්කම් ගිණුම් තැබීම් භාණ්ඩාගාර චක්‍රලේඛය | විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------------

2:1 **මූල්‍ය සමාලෝචනය**

---------------------

2.1.1 **මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කළමනාකරණ මණ්ඩලයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 894,478 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 2,919,119ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේදී ඌනතාවයෙහි රු. 2,024,641ක අඩුවීමක් නිරීක්ෂණය විය. මෙහෙයුම් වියදම් රු. මිලියන 02කින් අඩු වීම ඌනතාවය අඩු වීමට බලපා තිබුණි.

2.1.2 **මතභේදයට තුඩු දෙන ගණුදෙනු**

---------------------------------

මණ්ඩලය විසින් 2010 වර්ෂය සඳහා විදුලි හා ජල බිල්පත් ගාස්තු වශයෙන් පිළිවෙලින් රු. 27,323,893ක් හා රු.2,130,605ක් ගෙවා තිබුණි. මෙම ගාස්තු තුල උපර්මාධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ල තුල පවත්වාගෙන යන වෙනත් ආයතන වලට අදාල ජල හා විදුලි ගාස්තුද ඇතුලත්වී තිබුණු අතර එම ආයතන වල ගොඩනැගිලි කුලී සහ අදාල ජල හා විදුලි ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2 **මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

2.2.1 **කාර්ය සාධනය**

-----------------

ක්‍රියාකාරි සැලැස්ම ප්‍රකාරව වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු ව්‍යාපෘති 17 ක් අතරින් ව්‍යාපෘති 12 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් ව්‍යාපෘති 11 ක් සම්පූර්ණ කර තිබුණි.

2.2.2 **අයවැය ලේඛනමය පාලනය**

-----------------------------

සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස රු. 4,550,000ක් මණ්ඩලයට ලැබී තිබුණු අතර, එයින් උපයෝජනය කර තිබුණේ රු.1,650,000ක් පමණි.

3. **පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ඉන්වෙන්ට්‍රි

(ඇ) ණයගැති හා ණයහිමි පාලනය

(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය